## තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ ආයතනවල හා සංවිධානවල වගකීම් හා යුතුකම්

රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් මෙහෙයවීම කරනු ලබයි. මෙම සියලු කාර්යයන්හි දී පරිසරයේ ඇති වැදගත්කම දැඩි ලෙස අවධානයට ලක් කර තම කාර්යයන් සංවිධානය කිරීම වැදගත් වේ. විශේෂයෙන් පරිසර හානි පිළිබඳ සංවේදීවීම, ඒ පිළිබඳ විපරම් කිරීම හා සොයා බැලීම, නිවැරදි තොරතුරු රැස් කිරීම, ප්‍රකාශ කිරීම, ඒ හා සම්බන්ධ අදාළ ආයතන හා අංශ දැනුවත් කිරීම සඳහා මෙම සංවිධාන බැඳී සිටිය යුතු ය. සියලු කටයුතුවල දී තිරසර සංවර්ධනයේ වැදගත්කම පිළිබඳ ව විවිධ මාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීම කළ යුතු ය. විශේෂයෙන් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ දී පරිසර හිතකාමී ආකල්ප වර්ධනය, සරල දිවි පැවැත්ම පිළිබඳ සිතුම් පැතුම් හා චර්යාවන් සමාජ ගත කිරීමට යොමුවිය යුතු ය.

## තිරසර සංවර්ධනය පිළිබඳ රජයේ වගකීම් හා යුතුකම්

රාජ්‍ය ප්‍රතිපත්ති තුළ හා ඉදිරි දැක්ම තුළ තිරසාර සංවර්ධන සංකල්පය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම් හා කැපවීම් පාලකයින් සතු විය යුතු ය. මෙහි දී ජාතික පාරිසරික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම වැදගත් වේ. මෙමගින් රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීම, දැනුවත් කිරීම,මෙහෙයවීම සඳහා වගකීමෙන් බැඳී සිටිය යුතු ය. රාජ්‍ය නිලධාරීන් මගින් හා ආයතන මගින් මේ සියලු දැනුවත් කිරීම කළ යුතු ය. ජාතික පාරිසරික පනත් අදාළ ආයතන මගින් බල ගැන්වීම, නීතිය නිසියාකාර ව ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත් විය යුතු ය. කලින් කලට පරිසරයේ අවශ්‍යතා සලකා බලමින් ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් තීන්දු තීරණ ගත යුතු ය.

පරිසර විනාශයට ප්‍රධාන හේතුවක් ලෙස ජනතාවගේ දිළිඳුකම පෙන්වා දිය හැකි ය. එමගින් පරිසර සම්පත් අනවසර හා අවභාවිතයන් මගින් සූරා කෑමට ලක් කරයි. එය වැළැක්වීම සඳහා දිළිඳුකම පිටු දැකීමේ ක්‍රියා මාර්ග අනුගමනය කළ යුතු ය. රටක පවතින නිෂ්පාදනය, බෙදා හැරීම, පරිභෝජනය සම්බන්ධව පවතින අසමතුලිතතා අවම කිරීමට ක්‍රියා මාර්ග ගත යුතු ය. පරිසර හිතකාමී නිෂ්පාදන හා සේවා කෙරෙහි, ආයෝජකයින් දිරිමත් කිරීම ද කළ යුතු ය.

මේ අනුව තිරසාර සංවර්ධනය පවත්වා ගෙන යාම සඳහා රජය මගින් ඉටු කළ යුතුකම් හා රජයේ වගකීම් කිහිපයක් පහත දක්වා ඇත.

- පරිසර සංරක්ෂණ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී භාණ්ඩ හා සේවා නිෂ්පාදකයින් දිරි ගැන්වීම

